Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

# පළාත් සභා යටතේ පාසල් අධ්‍යාපනයේ පවතින ගැටලු; උතුරුමැද පළාත් සභාව ආශ්‍රයෙන් සිදුකරනු ලබන අධ්‍යයනයකි.

*කේ. ජී. එස්. මධුමාලි* [1]
*ප්‍රියන්ත මුදලිගේ* [2]

**සංක්ෂේපය**

නූතන ලෝකයේ රාජ්‍යයන් වැඩි වශයෙන් රාජ්‍ය පරිපාලනය විමධ්‍යගතකරණයට ක්‍රමයෙන් නැඹුරුවීමේ ප්‍රවණතාවක් දැකගත හැකි ය. ශ්‍රී ලංකාවේ පළාත් සභා ක්‍රමය මඟින් දේශපාලන බලය පවරාදීමේ ව්‍යුහාත්මක සැලැස්මක් 1987 දී ව්‍යවස්ථාගත විය. මෙම පර්යේෂණයේ මූලික අරමුණ වී ඇත්තේ, පළාත් සභාවට පැවරී ඇති කාර්යයන් නිසි පරිදි ඉටුවනවාද? නැද්ද? යන්න සොයා බැලීමයි. එහිදී පළාත් සභාවට පැවරී ඇති විෂයයන් ක්‍රියාත්මක කිරීමේ දී මුහුණ දීමට සිදුවන අභියෝග, දුෂ්කරතා හා ඒවාහි සාර්ථක හා අසාර්ථකතා මැන බැලීමට අපේක්ෂා කරන අතර එකී කාර්යය පළාත් සභා සතු අධ්‍යාපන විෂයය සම්බන්ධ බලතල යටතේ සාකච්ඡාවට ලක් කෙරේ. මේ අනුව පළාත් සභා යටතේ පවතින අධ්‍යාපන විෂයය ක්ෂේත්‍රය හඳුනාගැනීමටත්, පාසල් අධ්‍යාපනය නඟාසිටුවීමට අවශ්‍යකරන ක්‍රියාමාර්ගයන් හඳුනාගැනීමටත් අපේක්ෂා කෙරේ. මෙම පර්යේෂණයේ ගැටලුව වී ඇත්තේ, පළාත් සභා යටතේ වූ එක් විෂයයක් වන අධ්‍යාපනය සම්බන්ධයෙන් වන බලය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට හැකියාවක් පවතින්නේද? නැද්ද? යන්න අධ්‍යයනය කිරීමත් ය. පර්යේෂණ ක්‍රමවේදය යටතේ නියැදිය තෝරාගැනීමේ දී උතුරුමැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගලෙන්බිඳුණුවැව අධ්‍යාපන කලාපයෙහි පාසල් 94 අතරින් පාසල් 20 ක් තෝරාගන්නා ලදි. දත්ත රැස්කිරීමේ දී ප්‍රාථමික හා ද්විතීයික දත්ත යොදාගත් අතර ප්‍රාථමික දත්ත රැස්කිරීමේ දී ප්‍රශ්නමාලා හා සම්මුඛ සාකච්ඡා මඟින් දත්ත රැස්කරන ලදි. ද්විතීයික දත්ත රැස්කිරීමේ දී පර්යේෂණ ක්ෂේත්‍රය හා සම්බන්ධ ග්‍රන්ථ, සඟරා, අන්තර්ජාල ප්‍රකාශන වැනි මූලාශ්‍ර ද පරිශීලනය කරන ලදි. දත්ත විශ්ලේෂණය කිරීමේ දී පරිගණක මෘදුකාංගය භාවිතයෙන් Excel දත්ත ගොනුකරනු ලැබූ අතර වගු, ප්‍රස්තාර, මඟින් දත්ත ඉදිරිපත්කරන ලදි. මෙම පර්යේෂණයේ සොයාගැනීම් වශයෙන් උතුරු මැද පළාතේ මූලිකවම ගුරු හිඟයක් දැකගත හැකි වූ නමුත් ඇතැම් විෂයයන්වල ගුරු අතිරික්තයක් ද පෙන්නුම් කරයි. එසේම අධීක්ෂණ කටයුතු නිසි පරිදි ඒ ඒ දිනයන්හි සිදු වූව ද පාසල් සංඛ්‍යාව වැඩි වීමෙන් වසරකට එක් පාසලක් අධීක්ෂණය කළ හැකි වන්නේ දෙවතාවක් පමණි. මධ්‍යයේ බලපෑම හේතුවෙන් පළාත් සභාවලට ස්වාධීනව කටයුතු කිරීමට ද බලයක් නොවීම හේතුකොට ගෙන පාසල් අධ්‍යාපනයේ තීරණගැනීමේ ක්‍රියාවලිය තුළ ගැටලු උද්ගත වී ඇත. එසේම පාසලවල යටිතල පහසුකම් සඳහා ලැබෙන ප්‍රතිපාදන අවම වීමත් එම ප්‍රතිපාදන නිසිපරිදි කළමණාකරණය නොවීමෙන් ද ගැටලු උද්ගත වී ඇත. මේ අනුව නිගමනය කළ හැකි වන්නේ, පළාත් සභාවල අධ්‍යාපන විෂයය ක්‍රියාත්මක කිරීමේ දී ගැටලු උද්ගත වී ඇති බවත් මේ හේතුවෙන් බලය බෙදීමේ වෑයම තුළ ගැටලුවක් උද්ගත වී ඇති බවත් ය.

**ප්‍රමුඛ පදඃ බලය බෙදීම, පළාත් සභා, පාසල් අධ්‍යාපනය**

*1 ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය* Siranganimadhumali1990@gmail.com

*2 කථිකාචාර්ය, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය*